

# විශාන්තත්වය.



# විභත්‍යර්ථය.

අමරපුර ශ්‍රේණිප්‍රධාන සංඝනායක

ආචාර්ය

උඩකරවිට මහාතිස්ස අරියවංසාලඞ්කාර

ඥාණතිලක නායක ස්ථවිර පාදයන් විසින්

තවජිෂ්‍යවූ

ව ස් ක ඩු වේ දී පා ණ ඥ සා මි ස් ශේ න්

පරිශ්‍රමයඇනිවකරනලද

විස්තරවාඛ්‍යාසහිතයි.

---

කේ. ඕ. ඩී. සිල්වා වනමාවිසින්

වැලිතොට

වි ඥා ර ත්නා ක ර ය න් ත්‍රා ල යෙ හි

මුද්‍රණය කරවනලදි.

---

ශ්‍රී බු: 2449

ක්‍රි: 1905

# සංඥාපනය.

විඥාපනයයි—මෙමග්‍රන්ථය අරිමද්දනනුවරරාජ්‍යයක ලාවූ ක්‍යවවානම්රජහුගේ ප්‍රියදුහිතෘකුමාරිකාවක්විසින් බුද්ධවර්ෂ 2025 දී කරනලද්දේයි

මේ රජතෙමේ ත්‍රිපිටකධර්මයෙහිහා ශාස්ත්‍රයෙහිද අතිශය සමර්ථයෙක්ව සිටියේයි—

මොහුවිසින් සියලුරාජ්‍ය කාර්‍යයන් යුවරජහට භාරකොට පොකුණක්හැද පහයක් සාදවා එහි වැස භික්ෂූන්ටද අන්‍යාන්‍ය පූජාස්ත්‍රීන්ටද ධර්මශාස්ත්‍රයන් ඉගැන්වූ බවද අප විසින් ව්‍යාඛ්‍යාකොට මුද්‍රණයකරවනලද ශබ්දබින්දුනම්ප්‍රකරණයහා පරමත්ථබින්දුනම් ප්‍රකරණයක්ද කරනලදබවද මේකුමාරිකාවවිසින් මෙමවිභත්‍යර්ථ ග්‍රන්ථයකලබවද බුරුමරාජවලියෙන් දක්වනලද්දේයි—

මෙතෙමේ ධර්මයෙහිහා ශාස්ත්‍රයෙහිද දක්ෂයක් බැව් මෙයින් ප්‍රකාශවන්නීයි මේපොත ගාථා 37 කින්පමණයුත් ඉතාකුඩා පොතක්වූවත් ඒක ඒක විභක්තියට ඒක ඒක පරිච්ඡේදය බැගින් පරිච්ඡේදසත්කින්යුක්ත වූයේයි

මෙයවනාහි මේමේ විභක්තීන් මෙතෙක් මෙතෙක් අර්ථයයි පහසුවෙන් දැන ගැන්මම ඉතා උපකාර වන්නේයි—මෙය හොඳින් වාචෝද්ගත කොට අර්ථ අස්වාගෙණ භාවිතාකරන්නාහු කිසිතැනකදී විභක්තීන්ගේ අර්ථදැනගැන්මෙහි පසුබට නොවන්නෝයි—මෙය භාවිතාකිරීමෙන් විභක්ත්‍යර්ථ දැනගැන්මෙහි එකතින්ම දක්ෂවන්නෝයි—

අප ශාස්ත්‍රමන්දිරයෙහි මේපොත කුඩාපන්තිවලට උගන්වනලද්දක්බැවින් ශිෂ්‍යයන්ගේ උද්ග්‍රහණධාරණාදිය සඳහා මේව්‍යාඛ්‍යානය කරනලද්දේයි-මේව්‍යාඛ්‍යාව සම්පූර්ණයෙන් මේපොතේ තත්වාර්ථයන්තේරුම්ගැණීමට පිටිවහල්වනපරිද්දෙන් විස්තරකොට කරනලදබව පොත කියවීමෙන් දතහැක්කේයි—

සර්වඥනුවූ කිසිවෙකුට ඒකාන්තනිර්දෝෂදෙයක් කරනු නොහැක්කේයි. අපිදු පෘථග්ජන ස්වභාවවට ඇතුලත්ව දුහෙයින් මෙන්අපගේ ප්‍රමාදභ්‍රාන්ත්‍යාදියෙන්වූ දෝෂාංශුව කුදුතැනැයි නොකියමු සුධීහු ඒහිනිර්දෝෂාර්ථයම සලකත්වයි අපගේ ආශාවනායි—

# ශුද්ධිපත්‍රය.

| පිට | පෙළ | අශුද්ධි | ශුද්ධි |
|---|---|---|---|
| 3 | 25 | විභකතතතා | විභක්ත්‍යතතා |
| ,, | 26 | පදශයක් | පදයක් |
| 4 | 16 | සමුච්චයයිමෙම- | සමුච්චයයි—මෙම |
| ,, | 26 | සමුහංසම්මුති පුහගලං වා | සම්මුතිපුග්ගලං සමූහං වා |
| 7 | 15 | අතනාලෑබේ | අත්නාලෑබේ |
| 9 | 28 | විභක්තයෙන් | විභක්තියෙන් |
| 10 | 3 | පඤ්චමෙයකා දුසම්මිනි | පඤ්චමී මුද්‍රා ංගම්මිනී |
| ,, | 16 | එකාදස | චුද්දස |
| ,, | 17 | එකොළොස් | තුදුස් |
| 12 | 6 | පෘවජ්ජ | පෘවජ්ජාය — නවත් |
| 14 | ,, | ආපලමෙහ | ආලපමෙහ |
| 15 | 9 | මදිනසංච | මදිනසං |
| 20 | 16 | දක්වන | දැක්වන |
| 52 | 7 | ඉතාදිචේ | ඉතාදිවේ |
| 23 | 13 | [illegible] | ශයාගයා |
| ,, | 28 | චතුද්දෙහි | චතුද්දසෙහි |
| 30 | 7 | එකාදශෙහි | එකාදසෙහි |

27 පිටේ 8 වෙනි පෙළලගට මෙවා සගව [illegible] යි— පඤ්චමී මුද්දගෙහි, පඤ්චමියගේ [illegible], [illegible] නාම කම්පේද?

# විභත්‍යර්ථප්‍රකාශිකා

නම්වූ

# විභත්‍යර්ථ ව්‍යාඛ්‍යාව

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස

1 විභත්‍යර්ථස්ස ඤාතාරං විභත්‍යර්ථස්ස සම්භවං
විභත්‍යර්ථස්ස වත්තාරං බුද්ධං ධම්මං ගණම්පි ච.

2 විභත්‍යර්ථෙ විනෙතාරං විභත්‍යර්ථෙ පටුං මමං
විදුරං පඤ්ඤාමාණිම ථෙරං නත්වා ගරුම්පි මෙ.

3 විභත්‍යර්ථෙ සුරත්තෙන විභත්‍යර්ථගවෙසිනා
විසාරදෙන සුමන වංසත්ථෙරෙන යාචිතො.

4 විසෙසතො සාලකෙන විභත්‍යර්ථවිජානතෙ
විභත්‍යර්ථස්ස ව්‍යාඛ්‍යාන මිච්ඡතෙන සභාසයා.

5 විනීතෙන සමං දීපා නඤ්ඤ තෙනවාසිනා මම
විභත්‍යර්ථනයං පස්සං පාළිගන්ථකථාදිසු.

6 විභත්‍යර්ථස්ස ගන්ථස්ස විභත්‍යර්ථප්පදීපිනො
විභත්‍යර්ථප්පකාසිකං ව්‍යාඛ්‍යං කස්සං සභාසයා.

7 විධාචා යොසලාකාය ටිලානං රසනා සද
විසෙන මුච්ඡං නීතාව ග [illegible] ගුණවිභාවනෙ.

8 විඤ්ඤූනං වදනං පත්වා ගුණා යන්ති ගුණාකරා
නිට්ඨා පත්වා විඤ්ඤූනං මුඛං යන්තු ගුණාකරං.

(1) විභජ්ජවාදිං සම්බුද්ධං ධම්මං සුජනසෙවිතං
සංඝඤ්ච වන්දිත්වා කස්සං විභත්‍යත්ථං සුදුල්ලභං.

9 විපස්සිනොව තස්මා තු ගුණදෙසවිවෙචනෙ
විගතිස්සාවිධා හොන්ති මන්තා චෙකන්තපණ්ඩිතා
10 විභාවිමානිනො බාලා ඵවන්තු ගරහන්තු වා
විගතාගුණාගද්ධස්ස පරිසුද්ධස්ස තෙන කිං.

(ප්‍රකරණාරම්භයෙහි සකලාධ්‍යාත්මික බාහ්‍යොපද්‍රව නිවාරණයට සමර්ථවූ රත්නත්‍රයට ප්‍රණාම කරනපිණිස පළමුකොට "විභජ්ජවාදිං සම්බුද්ධං" යන ආදිය කීය)

(1) විභජ්ජවාදිං, විභාග කොට කියනසුලුවූ; සම්බුද්ධං, සර්වඥයන්වහන්සේද; සුජනසෙවිතං, (බුද්ධාදි) සත්පුරුෂයන්විසින් සෙවුනාලද්දවූ; ධම්මං, (සපර්යාප්තික නවලොකොත්තරයන්) ධර්මයද; සංඝංච, (අෂ්ටාර්යපුද්ගලමහා) සංඝයාවහන්සේද; වන්දිත්වා, වැඳ; සුදුල්ලභං, ඉතාදුර්ලභවූ; විභත්‍යත්ථං, විභත්‍යර්ථනම් ප්‍රකරණයක්; කස්සං, කරන්නෙමි—

(රත්නත්‍රය ප්‍රණාම ප්‍රයොජනය අන්‍යශාස්ත්‍රයන්හි බෙහෙවින් විස්තර කෙරෙත්-විශෙෂයෙන් උපද්‍රවඝාතනය කැමැති වෙත්—කියනලදමැයි—

නිපච්චකාරස්ස තස්ස කතස්ස රතනත්තයෙ
අනුභාවෙන සොසෙත්වා අන්තරායෙ අසෙසතො-ති

රත්නත්‍රයප්‍රණාමයනම් පරමාර්ථවශයෙන් කාමාවචරකුශලචෙතනාහී—ඕතොමෝ චනාහි ප්‍රථමජවනචිත්ත සම්ප්‍රයුක්තවූවාම මෙහි කැමැතිවනලදි—ඕතොමෝ වැන්දයුතුන්හට වදින්නවුන්ගේ ක්ෂෙත්‍රසම්පත්තියටද අධ්‍යාශය සම්පත්තියටද දෘෂ්ටධර්මවෙද්‍යව පෞරාණික

කුශලකර්මයට බලානුප්‍රදානවශයෙන් පූර්වකර්මයෙහි ප්‍ර
ස්ථිතවූ විපාකසන්තානයට අන්තරායකරවූ උපපීඩක උ
පච්ඡේදක සඞ්ඛ්‍යාත අකුශලකර්මයන් නසා එයට මූල
කාරණවූ රෝගාදි උපද්‍රවසඞ්ඛ්‍යාත අන්තරායයන්ගේ අ
නභිනිෂ්පත්තිය කෙරේ—එසේහෙයින් රත්නත්‍රය ප්‍රණා
මවචනය තමාවිසින් ප්‍රාරබ්ධ ප්‍රකරණයාගේ අනන්තරා
ය සිඬියපිණිසද ශිෂ්‍යානුශිෂ්‍යයන්ගේද ප්‍රණාමපූර්වඞ්ගමවූ
ප්‍රතිපත්තියෙන් උද්ග්‍රහණධාරණාදින්ගේ සංසිද්ධිය පිණි
සද වේ—

ගාථාවර්ණනාතොමෝ සම්බන්ධසංවර්ණනාය පද
ච්ඡේදසංවර්ණනාය පදාර්ථසංවර්ණනාය පදවිග්‍රහසං
වර්ණනාය චෝදනාසංවර්ණනාය පරිහාරසංවර්ණ
නායයි ෂට්ප්‍රකාර වේ—උක්තවැනි—

සම්බන්ධොච පදඤ්චෙව පදත්ථො පදවිග්ගහො
චොදනා පරිහාරොච ඡබ්බිධා ගාථවණ්ණනා—යි

එහි "කතමා—කිමත්ථඤ්ච මුච්චතෙ—පණාමපුබ්බක
කස්සුපනත්ථං" යනු සම්බන්ධ සංවර්ණනා නම්—පූර්වක
යතෙමේ ආශිංසනපූර්වකය වස්තුපූර්වකය ප්‍රණාමපූර්වක
යයි චතුර්විධයි—මේප්‍රණාමපූර්වකයි—

'විභජ්ජවාදිං' යනු එක්පදයෙක-'සම්බුද්ධං' යනු එක්පද
යෙක-'ධම්මං' යනු එක්පදයෙක-'සුජනසෙවිතං' යනු එ
ක්පදයෙක-'සංඝං' යනු එක්පදයෙක-'ච' යනු එක්පද
යෙක-'වන්දිත්වා' යනු එක්පදයෙක-'කස්සං' යනු එක්ප
දයෙක-'විභත්‍යත්ථං' යනු එක්පදයෙක-'සුබුල්ලනං' යනු
එක්පදයෙක—මෙසේ මේගාථාතොමෝ විභක්ත්‍යන්තප
දවිභාගවශයෙන් දශපදයෙක්ඇත්තීයයි දතයුත්තීය-'වි
භජ්ජවාදිං' යනු විශෙෂණපදය—'සම්බුද්ධං' යනු කර්මා

ර්ථපදය--'ධම්මං' යනු කර්මාර්ථපදය-'සුජනසෙවිතං' ය
නු තද්විශෙෂණපදය-'සංඝං' යනු කර්මාර්ථපදය-'ච' ය
නු සමුච්චයාර්ථවාචකනිපාතපදය -'වන්දිත්වා' යනු පූර්ව
කාලක්‍රියාපදය--'කස්සං' යනු අපරකාලක්‍රියාපදය--'විභ
ත්‍යත්ථං' යනු කර්මාර්ථපදය-'සුදුල්ලභං' යනු තද්විශෙෂ
ණපදයි--මේගාථාතොමෝ නොයෙක්ගාථාවන් අතුරෙ
න් පථ්‍යාවක්ත්‍රගාථා නම්-මේ පදච්ඡෙදසංවර්ණනායි.

පදාර්ථයතෙම පාඨානුසාරී සම්බන්ධය උපමාසම්බන්ධ
ය හෙතුසම්බන්ධය උපමාහෙතුසම්බන්ධයයි කියා චතුර්
විධයි—

"විභජ්ජවාදිං සම්බුද්ධංච සුජනසෙවිතං ධම්මංච සංඝං
ච වන්දිත්වා සුදුල්ලභං විභත්‍යත්ථං කස්සං" යනු සම්බන්ධ
යි-මේපදාර්ථසමුච්චයයි—

"විභජ්ජවාදිං සම්බුද්ධංච වන්දිත්වා සුජනසෙවිතං ධම්මං
ච වන්දිත්වා සංඝංච වන්දිත්වා සුදුල්ලභං විභත්‍යත්ථං අහං
කස්සං" යනු සම්බන්ධයි—මේ වාක්‍යාර්ථසමුච්චයයි මේ—
දෙකම පාඨානුසාරිසම්බන්ධයයි දතයුතු—

"අහං විභජ්ජවාදින්ති විභජ්ජ වදනසීලං වදන ධම්මං
වදනෙ සාධුකාරිං වා—බුද්ධන්ති සයමෙව අබුජ්ඣි බුජ්ඣ
ති බුජ්ඣිස්සති සඞ්ඛතාසඞ්ඛතභෙදෙ සබ්බධම්මෙති
අත්ථො--වන්දිත්වාති (අති සඥාමව ආදරෙන) වන්දිත්වා ස
යලොක කුලාචාරවිරහෙනාති අත්ථො-සුජනසෙවිතන්ති
බුද්ධාදි සාධුසෙවිතං නදිට්ඨාදීති අත්ථො—ධම්මන්ති න
වලොකුත්තරධම්මං සපරියත්තිකංවා දසධම්මන්ති අ
ත්ථො--වන්දිත්වාති සම්බන්ධො—සංඝන්ති අට්ඨඅරිය පුග්ග
ලසමූහං සම්මුතිපුග්ගල සමූහං වා—චසද්දො ධම්ම
ස්ස සංඝංච සමුච්චෙති—සුදුල්ලභන්ති අතිදුල්ලභං සුඛ

ශේෂ, අතිරේකාර්ථ වාචක උපසර්ගයා — විභත්‍යත්ථන්ති විභක්තීනං අර්ථ: —

කථයිස්සන්ති කරිස්සාමි භාසිස්සාමීති අර්ථ:- මේද පාඨානුසාරි සම්බන්ධනම් —

"විපස්සීආදයො යථා විභජ්ජවාදිනො එවං විභජ්ජවාදිං — විපස්සී ආදයො යථා සම්බුද්ධා එවං සම්බුද්ධං ගෝතමං, පුබ්බ යථා ආචරියා අභිවන්දිංසු එවං අහං (අපි සක්කච්ච ආදරෙන) වන්දාමි" යනු උපමාසම්බන්ධ නම් —

"විපස්සී ආදයො විභජ්ජවාදිතතො විභජ්ජවාදිං, විපස්සී ආදයො සම්බුද්ධතතො සම්බුද්ධං පුබ්බෙ ආචරියෙහි අභිවන්දිතතො අහං (අපි සක්කච්ච ආදරෙන) වන්දාමි" යනු හෙතු සම්බන්ධ නම් —

"විපස්සී ආදයො යථා විභජ්ජවාදී විභජ්ජවාදිතතො විභජ්ජවාදිං, විපස්සී ආදයො යථා සම්බුද්ධා සම්බුද්ධතතො සම්බුද්ධං, පුබ්බෙ ආචරියා යථා අභිවන්දිංසු අභිවන්දිතතො අහං(අපි සක්කච්ච ආදරෙන වන්දාමි) යනු උපමාහෙතු සම්බන්ධ නම් — උක්තමැනු —

පාඨානුසාරී සම්බන්ධො සම්බන්ධො උපමායච
හෙතුනාපිච සම්බන්ධො උපමාහෙතුනාපිච
සම්බන්ධභෙද විඤ්ඤෙය්‍යා චතුරෙති විභාවිනා — සී

"විවිධං භාජෙත්වා වදන සීලො වදන ධම්මො වදනො සාධුකාරිති වා විභජ්ජවාදී" (විපුබ්බ භජ පුබ්බ වද ව්‍යක්තායං වාචායං — ණී) විවිධං, විවිධකොට; භාජෙත්වා, බෙද; වදනසීලො, කියනසුලුනුසිහෝ, වදන ධම්මො, කියන ස්වභාව ඇත්තේ නුසිහෝ; වදනො, කීමෙති; සාධුකාරී ඉතිවා, දක්ෂනුයිහෝ විභජ්ජවාදී, විභජ්ජවාදීනම් — නොහොත් 'විභජ්ජතෙති විභජ්ජ:'' විභජ්ජය

තෙ ඉති, එබඳුනුලැබෙනුයී; විභජ්ජා විභජ්ජ නම්-"වදන්ති සීලෙනාති වාදී" සීලෙන, ස්වභාවයෙන්; වදති ඉති, කියානුයී; වාදී, වාදී නම් -"විභජ්ජං එව වදී විභජ්ජවාදී" තං විභජ්ජවාදිං--විභජ්ජ එව, විභජ්ජයම; වාදි, කියන සුලුවූයේ; විභජ්ජවාදී; විභජ්ජවාදී නම් —

"සම්බුජ්ඣතීති සම්බුද්ධො" (ස පුබ්බබුද්ධබොධනෙ — ත) සම්බුජ්ඣති ඉති මනාව අවබොධකෙරේනුයි; සම්බුද්ධො, සම්බුද්ධ නම් — "සයමෙව බුද්ධොති වා සම්බුද්ධො" තං සම්බුද්ධං — සයං එව, තෙමේම; බුද්ධො ඉතිවා, අවබොධකළේනුයීහෝ; සම්බුද්ධො, සම්බුද්ධ නම් —

"යථානුසිට්ඨං පටිපජ්ජමානෙ චතූසු අපායෙසු වට්ටදුක්ඛෙසු ච අපතමානෙ කත්වා ධාරෙතීති ධම්මො" (ධර ධාරණෙ — රම්ම) යථානුසිට්ඨං, අනුශාසනාකරනලදපරිද්දෙන්, පටිපජ්ජමානෙ, පිළිපදිනවුන්; චතූසු අපායෙසු, සතරඅපායන්හිද, වට්ටදුක්ඛෙසුච, වෘත්තදුඃඛයන්හිද, අපතමානෙකත්වා, නොවැටෙන්නවුන් කොට, ධාරෙති ඉති, දරානුයී, ධම්මො, ධම්ම නම්-"කක්ඛළඵුසනාදිකං සකසකලක්ඛණං ධාරෙතීතිවා ධම්මො" කක්ඛළඵුසනාදිකං, කර්කශස්පර්ශාදී ද්‍රව්‍ය; සකසකලක්ඛණං, ස්වකීය ස්වකීය ලක්‍ෂණය, ධාරෙති ඉතිවා, දරානුයීහෝ; ධම්මො, ධම්ම නම්--"ධාරීයතෙ ලක්ඛීයතෙති වා ධම්මො" ධාරීයතෙයිශේෂයි; ලක්ඛීයතෙ ඉතිවා, දන්නාලැබෙනුයීහෝ; ධම්මො, ධම්ම නම් — "පාපකෙ අකුසලෙ ධම්මෙ ධුනාති විධංසෙතීති වා ධම්මො" (ධු කම්පනෙ—රම්ම) තං ධම්මං--පාපකෙ, ලාමකවූ; අකුසලෙ ධම්මෙ, අකුශල ධර්මයන්; ධුනාතියිශේෂයි, විධංසෙති ඉතිවා, නසානුයීහෝ; ධම්මො, ධම්ම නම් —

"සුජනෙන සෙවිතො සුජනසෙවිතො" තං සුජනසෙවිතං" සුජනෙන, සත්පුරුෂයන්විසින්; සෙවිතො,

සෙවුනාලද්දේ, සුජනසෙවිතො, සුජනසෙවිත නම්— "සං සුට්ඨු කිලෙසෙ හනතීති සංඝො" (සං පුබ්බ හන හිංසා ගතියං – ණ) සංඝයෙසේයි; සුට්ඨු, මනා කොට; කිලෙසෙ, කෙලෙසුන්; හනති නසයිසේදී; ඉති, එහෙයින්, නසානුයි; සංඝො, සංඝ නම්—"සමග්ගං කම්මං සමුපගච්ඡතීති වා සංඝො" තං සංඝං– සමග්ගං කම්මං, සමගික මෑට; සමුපගච්ඡති ඉති වා, එළඹේනුයිනේ; සංඝො, සංඝ නම්—"විජ්ජිය විජ්ජුම්හිත්වා විජ්ජිතො" විජ්ජිය, වැදනු යිනේ, විජ්ජුම්භිත්වා, විදිමිනු යිනො; විජ්ජිතො, විජ්ජිතො යනු වේ--"ඝ ඝං" යන මෙහි 'ඝරකරණෙ' යනබාතුයි සංවිං කානියි— "විභජතීති විභත්ති" (විපුබ්බ භජ පුථක්කරණෙ-ති) විභජති ඉති, බෙදනුයි, විභත්ති, විභත්ති නම්— "විභඞ්ගං භජතීති විභත්ති" මිද විග්‍රහ කටයුතු— "අරියතීති අත්‍ථො" (අරගමනෙ–ථ අරියතීසේදී; ඤායතිඉති, දන් නාලැබෙනුයි; අත්‍ථො, අර්ථ නම— "ඤාණ හිමුඛං අරති ගච්ඡතීති වා අත්‍ථො" ඤාණා භිමුඛං, ඥාන යට අභිමුඛව, අරති යීසේයි. ගච්ඡති ඉති වා, එළඹෙනුයි හෝ; අත්‍ථො, අර්ථ නම්-"විභත්‍ථ ගං අත්‍ථො විභත්‍ථො" තං විභඞ්ගත්‍ථං–විභත්‍ථ නං, විභඞ්ගයන්ගේ; අත්‍ථො, අර්ථයනම; විභඞ්ගත්‍ථො. විභඞ්ගත්‍ථ නම්--"සුට්ඨු දුල්ලභො සුදුල්ලභො" තං සුදුල්ලභං' සුට්ඨු, අතිශයින්; දුල්ලභො, දුර්ලභවූයේ, සුදුල්ලභො සුදුල්ලභ, නම්— මෙසේ දවිග්‍රහ සංවණ්ණනායි—

මෙහි වනාහි විභඞ්ගාර්ථප්‍රකරණය "විභජ්ජවාදිං" යන ඇදි පදයෙන් දක්වනලදබැවින් "ධම්මෙකාදසත්‍ථම්හි" යන ආදිමෙහි විභඞ්ගාර්ථප්‍රකරණය වියයුතුය "විභජ්ජවාදිං" යන ඇදියෙහි නොවියයුතුය යනු චොදනායි—

නොවියයුතුය කුමක්හෙයින්දයත් මෙහි වනාහි ප්‍රණාමය කැමැතිවනලදබැවින් මෙහි ප්‍රකරණය නොකැමැ

හිව රත්නත්‍රය ප්‍රණාමය නැතිව ප්‍රකරණයාගේ නොනිමියහැකිබැවිනි—රත්නත්‍රය ප්‍රණාමයෙන් දක්ව පුලබිනකල්හි අනන්තරායවළකානබැවින් මෙහි "විභජ්ජවාදිං" යනු ආදි පදයෙන් නිර්දෙශ කරනලද්දේය. ප්‍රකාරණවිශෙෂණයාගේ කිරීමපිණිස නිර්දෙශ නොකරන ලද්දේය යනු පරිහාරයි—

නොහොත් 'විභජ්ජවාදිං" යනු ආදි පාඨයෝ කුමක් පිණිස කියනලද්දුහුද විභත්‍යර්ථප්‍රකරණයාගේ කිරීම පිණිසය—

විභත්‍යර්ථප්‍රකරණයාගේ කිරීමපිණිස මේ "විභජ්ජ වාදිං" යනු ආදිය කියනලද්දේයයි කීකල්හි "පඨමකාදසන්මිහි—පෙ—සත්තමෙ‍්‍යකාදසත්මිහි" යනු ආදි පාඨයෙන් විභත්‍යර්ථප්‍රකරණය නොවන්නේ ය—මේ "විභජ්ජවාදිං" යනු ආදියද විභත්‍යර්ථප්‍රකරණයයි පැමිණෙන්නේය—"පඨමෙකාදසත්මිහි—පෙ—සත්තමෙ‍්‍යකාදසත්මිහි" යනු ආදියෙන් විභත්‍යර්ථප්‍රකරණය වේ—මෙයින් විභත්‍යර්ථප්‍රකරණය කරනලදබැවින් විභත්‍යර්ථප්‍රකාරණයපිණිස "විභජ්ජවාදිං" යනු ආදි පාඨයෝ නොකියයුතු වන්නාහුයයි විචාරණලද කල්හි ප්‍රතිඥාතව්‍ය ප්‍රතිඥාකරණ විරොධිදොෂය වන්නේ ය යනු චොදනායි—

එයින්ම විභත්‍යර්ථ මෙන් සච්චසඞ්ග්‍රහකාරයන්ගේ සබ්භාවයෙන් ප්‍රණාම ප්‍රණාමිතව්‍ය ප්‍රණාමහෙතු ප්‍රතිඥා ප්‍රතිඥාතව්‍යයන් දක්වනපිණිස "විභජ්ජ වාදිං" යනු ආදිය කියනලද්දේය—

ඔවුන් අතුරෙන් "වන්දිත්වා" යනු පදයෙන් ප්‍රණාමය දක්වයි—"සම්බුද්ධං ධම්මං සංඝං" යනු මෙයින් ප්‍රණාමිතව්‍යය දක්වයි—"විභජ්ජවාදිං සුජනසෙවිතං" යනු

(8) විජ්ජමානොපි සුක්කාදි යථා දීපාදිකෙ සති
බ්‍යත්තිමායාති කත්තාදි අත්ථො එවං විභත්තියා—

මෙයින් ප්‍රණාමහෙතුව දක්වයි—“අහං” යන පදයෙන් කර්තෘාර්ථය දක්වයි—“සුදුල්ලභං” යන පදයෙන් ප්‍රතිඥාව දක්වයි—“කස්සං” යන පදයෙන් ප්‍රතිඥාතව්‍ය දක්වයි—මෙසේ “පඨමෙකාදසත්ථම්හි—පෙ—සත්තමෙ‍්‍යකාදසත්ථම්හි” යන ආදි පාඨයෙන්ම මේ විභක්ත්‍යර්ථප්‍රකරණය වනාහි නොකියනලදබැවින් ප්‍රතිඥාතව්‍ය ප්‍රතිඥාකරණ විරොධදොෂය නොපැමිණෙන්නේය යනු පරිහාරයි—

(මෙසේ “විභජ්ජාදිං” යන ආදියෙන් ප්‍රණාමාදිපූර්වපක්ෂය දක්වා දැන් විභක්තියගේ උපමා උපමෙය දක්වනපිණිස “විජ්ජමානොපි සුක්කාදි” යන ආදිය කීය)

(8) යථා, යම්සේ; සුක්කාදි, ශ්වෙතාදිවර්ණයෙක් තෙමේ; විජ්ජමානො අපි, විද්‍යමානවූයේද; දීපාදිකෙ, ප්‍රදීපසූර්‍යාදීහු; සති, ඇතිකල්හි; බ්‍යත්තිං, ප්‍රකාශවීමට; ආයාති, ඒද; එවං, එසේම; විභත්තියා, විභක්තිය ඇතිකල්හි; කත්තාදිඅත්ථො, කර්තෘාදි අර්ථයතෙම; (ප්‍රකටබවට එන්නේ) වේ

(“විජ්ජමානොපි සුක්කාදි යථා දීපාදිකෙ සති බ්‍යත්තිමායාති” යන මෙයින් විභක්තියගේ අප්‍රකටකරණය ප්‍රකටවූ ලොකොපමාවකින් ගෙණැර උපමාර්ථය දක්වූයේය—“කත්තාදි අත්ථො එවං විභත්තියා” යන මෙයින් උපමෙයාර්ථයද කර්තෘාදිවිභක්තීන්ගේ ගුණයද ප්‍රකාශ කිරීමපිණිස දක්වූයේය—ඔවුන් අතුරෙහුදු අප්‍රකට වස්තුව උපමා නම්—ප්‍රකටවස්තුව උපමෙය නම් ඒදෙකම එකම විභක්තියෙන් යුක්තවන්නේයි—උක්තමැනු-

(3) පඨමෙකාදසන්නම්හි දසම්හි දුතියා භවෙ
තතියා සොළසන්නම්හි චතුත්ථී චුද්දසී ඊරිතා—

(4) පඤ්චමී චුද්දසන්නම්හි ඡට්ඨී එකාදසී ඊරිතා
සත්තමෙකාදසන්නම්හි විසත්ත සත්තාසීතියං—

"සාධම්ම සාධනං සිඛ මසිඛසෙසා පමාතකං
උපමෙය්‍ය මසිඛං තං වය මෙකවිභත්තිකං—යි

(මෙසේ "විභජ්ජවාදිං" යන ආදිවූ පූර්වාසංඥකයද "විජ්ජමානො පි සුත්තාදි" යන ආදිවූ උපමා උපමෙය්‍යභාවයද දක්වා දුන් විභක්ත්‍යර්ථය දක්වනපිණිස "පඨමෙකාදසන්නම්හි" යන ආදිය කීය)

(3) පඨමා, ප්‍රථමාවිභක්තිතොමෝ; එකාදසන්නම්හි, එකොළොස් අර්ථයෙක්හිද; දුතියා, ද්විතීයාවිභක්තිතොමෝ; දසම්හි, දශාර්ථයෙක්හිද; භවෙ, වන්නේය; තතියා, තෘතීයාවිභක්තිතොමෝ; චුද්දසෙ, තුදුස්අර්ථයෙක්හි; (වේයයි) ඊරිතා, කියනලද්දීය—

(4) පඤ්චමී, පඤ්චමීවිභක්තිතොමෝ; චුද්දසන්නම්හි; තුදුස්අර්ථයෙක්හිද; ඡට්ඨී, ෂෂ්ඨීවිභක්තිතොමෝ, එකාදසෙ, එකොළොස්අර්ථයෙක්හිද; සත්තමී, සප්තමීවිභක්තිතොමෝ, එකාදසන්නම්හි, එකොළොස්අර්ථයෙක්හිද; (වේයයි) ඊරිතා, කියනලද්දීය; විසත්ත, තුදුස්විභක්තිහු; සත්තාසීතියං, අසූසත්අර්ථයෙක්හි වෙත්,

("පඨමෙ ජාතා පඨමා"—පඨමෙ, පළමුවැන්නෙහි; ජාතා, වූවා; පඨමා, පඨමා නම්—"එකොච දසච එකාදස" එකොච, එකක්ද; දසච, දශයක්ද; එකාදස, එකාදස නම් "එකාදසන්නං අත්ථො එකාදසත්ථො" තස්මිං—එකාදසන්නං, එකොළොස්දෙනෙක්හුගේ; අ

## කතමො පඨමාඑකාදසකො. *

කො, අවියතෙම; එකාදසකො, එකාදසකො නම්—“දසන්නං පූරණො දසො” තස්මිං-දසන්නං, දශදෙනාගේ; පූරණො පුරන්නේ; දසො, දස නම්—‘ද්වින්නං පූරණී දුතියා—තිණ්ණං පූරණී තතියා—චතුන්නං පූරණී චතුත්ථී” මෙහි අවිසුබොධයි—“චුද්දසන්නං පූරණො චුද්දසො” තස්මිං—චුද්දසන්නං, තුදුස්දෙනාගේ; පූරණො පුරන්නේ, චුද්දසො, චුද්දස නම්—

“පඤ්චමී—ඡට්ඨී—සත්තමී” ශබ්දයෝ “දුතියා” ශබ්දයෙහි සිද්ධින් විග්‍රහ කටයුත්තාහුය—එකවචනය සප්තමියයි බහුවචනයද සප්තමියයි—ඒදෙකම එක්කොට “විසත්තා” යයි කියනලදී)

(මෙසේ “පඨමෙකාදසකම්හි” යන ආදි සමුදායාර්ථය දක්වා දූන් අවයවාර්ථය දක්වනුපිණිස “කතමො” යන ආදිය කීය—නොහොත් “පඨමෙකාදසකම්හි” යන ආදි මාතෘකාපදය දක්වා දූන් පදභාජනීයභාවය විභාග කොට දක්වන්නේ “කතමො” යන ආදිය කීය—නොහොත් මෙසේ උද්දේශභාවය දක්වා දූන් නිද්දේශභාවය දක්වන්නේ “කතමො” යන ආදිය කීය—නොහොත් මෙසේ සාමාන්‍යභාවය දක්වා දූන් විශෙෂාර්ථභාවය දක්වන්නේ “කතමො” යන ආදිය කීය—නොහොත් මෙසේ සමුදායාර්ථභාවයද මාතෘකාභාවයද උද්දේශභාවයද සාමාන්‍යයද දක්වා දූන් අවයවයද පදභාජනීයභාවයද නිද්දේශභාවයද විශෙෂාර්ථභාවයද දක්වන්නේ “කතමො” යන ආදිය කීය)

* පඨමො එකාදසකො, ප්‍රථමවිභක්තියගේ එකොළොස්අවියතෙම, කතමො කවරේද?

(5) ලිඞ්ග හෙතු කත්තු කම්ම කරණ සම්පදානතෝ
සාම්‍යාවධිභූමෙම දිසා ලපනෙ පඨමා භවෙ—

(කතමො යත්‍ර සච්චනාමයි- මේ දශවිධ සච්චනාමයන් අතුරෙන් පඤ්ඤාසච්චනාමයි — පඤ්ඤාතොමෝ අදිට්ඨජොතන පඤ්ඤාය දිට්ඨසංසන්දන පඤ්ඤාය විමතිච්ඡේදන පඤ්ඤාය අනුමතිපඤ්ඤාය කථෙතුකම්‍යතාපඤ්ඤායයිපඤ්ච විධවේ — ඔවුන් අතුරෙන් මේ කථෙතුකම්‍යතා පඤ්ඤායි. කථෙතුකම්‍යතා පඤ්ඤාවද සත්තාධිට්ඨාන ධම්මාධිට්ඨාන වශයෙන් ද්විප්‍රකාරයි-- ඔවුන් අතුරෙන් මෙධම්මාධිට්ඨාන පඤ්ඤා නම් — එකාධිට්ඨාන අනෙකාධිට්ඨාන වශයෙන්ද ද්විප්‍රකාරයි — ඔවුන් අතුරෙන්ද මේ එකාධිට්ඨාන පඤ්ඤා නම්- සම්මුතිවිෂය පරමාර්ථවිෂයවශයෙන්ද ද්විප්‍රකාරයි ඔවුන් අතුරෙන් මේපරමාර්ථවිෂය පඤ්ඤායයි දතයුතු)

(දැන් පඤ්ඤාවට අනුරූපවූ විසජ්ජනාභාවයයි කියන ලද ප්‍රථමාවිභක්තියගේ අර්ථවිශෙෂය විභාගකොට දක්වනපිණිස "ලිඞ්ග හෙතු කත්තු කම්ම" යන ආදිය කීය)

(5) ලිඞ්ග, ලිඞ්ගාර්ථය; හෙතු, හෙත්වර්ථය; කත්තු, කර්ත්‍රර්ථය; කම්ම, කර්මාර්ථය; කරණ, කරණාර්ථය; යන මෙහිද; සම්පදානතෝ, සම්ප්‍රදානාර්ථයෙන්ද; සාමි, ස්වාම්‍යර්ථය; අවධි, අවධ්‍යර්ථය; භූමෙම, ආධාරාර්ථය යන මෙහිද; දිසා, දිශාර්ථය; ආලපනෙ, ආලපනාර්ථය යන මෙහිද; පඨමා, ප්‍රථමාවිභක්තිතොමෝ; භවෙ, වන්නේය—

("ලීනං අඞ්ගතීති ලිඞ්ගං" ලීනං, අප්‍රකටවූ; අඞ්ගතීති, අවගමයනුයි; ලිඞ්ගං, ලිඞ්ග නම් — (යම්සේ කෙසෙලෝමාදීන්ගේ ගර්භපත්‍රය අප්‍රකට අවයවයෝද එසේම "පුරිසො" යන ආදි නිෂ්පන්නපදයන්ගේ

(6) බුද්ධො දසබලොත්‍යාදි ලිඞ්ගත්ථො ති තතො කමා
යො බොධිරුක්ඛංරොපෙති යොච පබ්බජිතො නරො-
(7) සත්ථාරා දෙසිතො ධම්මො වෛය්‍යාවිතත මදීනතඤ්ච
කාරකො දෙති විපාකො සබ්බෙ බුද්ධා තු ත්‍යාදිච-

පළමුකොටම තැබියයුතුවූ රූපය අප්‍රකට අවයව බැවින් ලිඞ්ගයයි කියනුලැබේ—"හිනොති පවත්තති එතෙනාති හෙතු" (හිගතියං—තු) "කරෙතීති කත්තා" (කරකරණෙ—තු) "කරීයතෙති කම්මං" (කරකරණෙ—රම්ම) කරෙති අනෙනාති කරණං" (කරකරණෙ—යු) "ලිඞ්ගංච හෙතුච කත්තාච කම්මඤ්ච කරණංච ලිඞ්ග—පෙ—කරණං" තස්මිං—මෙහි අත්ථශබ්දය සම්බන්ධ කටයුත්තේය—"සංපෙච්ච අස්ස දදාතීති සම්පදානං" (සංපුබ්බ පපුබ්බ දාදානෙ—යු) "සම්පදානස්ස අත්ථො සම්පදානත්ථො" තස්මිං—මෙහිමතු ත්‍රම ඇති සුගමයි-අපාදානයම පිරිසිඳියයුතුබැවින් අවධියයි කියනුලැබේ—ආධාරයම අවකාශස්ථානහෙයින් භූමියයි කියනු ලැබේ)

(මෙසේ මේ එකාදශාර්ථයාගේ ලක්ෂණය විභාග කොට දක්වා දැන් ලක්ෂ්‍යය විභාග කොට දක්වනපිණිස "බුද්ධොදසබලොත්‍යාදි" යන ආදිය කීය)

(6) බුද්ධො දසබලො ඉති, බුද්ධො දසබලො යන; ආදි, ඒ ආදියෙන්තමේ; ලිඞ්ගත්ථො ඉති, ලිඞ්ගාර්ථයයි කියනු ලැබේ; තතො, ඉක්බිතිව, කමා, ක්‍රමයෙන්, යො බොධි රුක්ඛං රොපෙති, යො බොධිරුක්ඛං රොපෙති යනුද; යොච පබ්බජිතො නරො, යො පබ්බජිතො නරො යනුද—

(7) සත්ථාරා දෙසිතො ධම්මො, සත්ථාරා දෙසිතො ධම්මො යනුද; වෛය්‍යාවිතත මදීනතංච, වෛය්‍යාවිතත මදීනතං යනුද; කාරකො දෙති විපාකො, කාරකො දෙති විපා

(9) ලොභාදයො ඉමෙ ධම්මා බුද්ධො දූරතරෙ හවෙ
භගවා චිත්ත මිස්සරෙ දිසායොගෙන සො තදා
භොරජ ලපනෙ චෙව පයොගානි යථාරහං—

**පඨමාවිභත්‍යත්ථො සමත්තො—1**

---

කො යනුද; සබ්බබුද්ධාතුත්‍යාදිච, සබ්බෙ බුද්ධා තෙ ජනා යන ආදියද—

(8) ලොභාදයො ඉමෙ ධම්මා බුද්ධො දූරතරෙ හවෙ, ලොභාදයො ඉමෙ ධම්මා බුද්ධො දූරතරෙ හවෙ යනුද; භගවා චිත්ත මිස්සරෙ, භගවා චිත්ත මිස්සරෙ යනුද; දිසායොගෙන සො තදා, දිසායොගෙන සො තදා යනුද; ආලපනෙ ආලපනයෙහි; භොරජ ච එව, භොරජ යනුද; පයොගානි, උදාහරණයෝ; යථාරහං, සුදුසුපරිද්දෙන් (දතයුත්තාහු) වෙත්—

("බුද්ධො දසබලො" යනු ලිඞ්ගාර්ථොදාහරණයි—දසබලො, දශබලයක්ඇත්තාවූ; බුද්ධො, සර්වඥය—මෙහි බුද්ධශබ්දයාකෙරෙන් "ලිඞ්ගත්ථෙ පඨමා" යන සූත්‍රයෙන් ලිඞ්ගාර්ථමාත්‍රයෙහිම ප්‍රථමාවිභක්ති කොට "සො" යන සූත්‍රයෙන් අකාරාන්තයාකෙරෙන් සිහට ඔකාරාදෙශ කළ කල්හි "බුද්ධො" යි රූපසි—"සො බොධිරුක්ඛං රොපෙති" යනු හෙත්වර්ථොදාහරණයි-සො, තමෙක්තෙම; බොධිරුක්ඛං, බොධිවෘක්ෂය; රොපෙති, රොපණයකෙරේද-මෙහි "සො" යන පදය ප්‍රථමාවශයෙන් කියනලදි-"රොපෙති" යනු ලබනලද ධාතුසංඥදිය ඇති"ධාතූහිණෙණ ණයණාපෙණාපයා කාරිතානි හෙතුඅත්ථෙ" යන සූත්‍රයෙන් හෙත්වර්ථයෙහි කරනලද ණෙප්‍රත්‍යයා අන්තකොට ඇති "කාරිතානං ණො ලොපං" යන සූත්‍රයෙන් ණකාරය ලොප්කළකල්හි "අසංයොගන්තස්ස වුද්ධි කාරිතෙ" යන සූත්‍රයෙන් කරනලද වෘද්ධිඇති "රුපරොපණෙ"

## කතමො දුතියාදසත්ථො?

යන ධාතුහුගේ "ධාතුප්පච්චයෙහි විභත්තියො" යන සූත්‍රයෙන් ත්‍රිවිභක්තිකළකල්හි "රෙපෙති" කියා රූපසිද්ධ වේ—"යො පබ්බජිතො නරෙ" යනු කර්තෘවේදාහරණයි— යො නරෙ, යම් මනුෂ්‍යයෙක්තෙමේ; පබ්බජිතො, පැවිදිවූයේද—"සත්ථාරා දෙසිතො ධම්මො" යනු කර්මාවේදාහරණයි—සත්ථාරා, ශාස්තෘත්වහත් සේවිසිත්; ධම්මො, ධර්ම්‍යතෙම; දෙසිතො, දෙසන ලදී—"ජෙය්‍යවිත්තං අදින්නංච" යනු කාරණාවේදාහරණයි—ජෙය්‍යවිත්තං, සොරසිතින්; අදින්නං, නුදුන්දෙය ගත්තාලදී—"කාරකො දෙති විපාකො" යනු සම්ප්‍රදානාවේදාහරණයි—කාරකො, කරන්නාහට; විපාකො දෙති, විපාක දේ—"සබ්බබුද්ධා-තෙජනා" යන ආදිය ස්වාම්‍යාවේදාහරණයි— සබ්බබුද්ධා, සියලුබුදුවරයන්ගේ— තෙජනා, ඒජනයන්ගේ-"ලොභාදයො ඉමෙ ධම්මා බුද්ධො දූරතරෙ භවෙ" යනු අවධ්‍යාවේදාහරණයි—බුද්ධො, සර්වඥතෙමේ; ලොභාදයො, ලොභාදිවූ; ඉමෙධම්මා, මේධර්ම්‍යන්කෙරෙන්; දූරතරෙ භවෙ, ඉතාදුරු වන්නේය—"භගවා විහාර විස්සරෙ" යනු ආධාරාවේදාහරණයි—භගවා, භාග්‍යවත්තෙමේ; විහාරං, සිතෙහි; ඉස්සරෙ, ප්‍රධානයි-"දිසායොගෙන සො තදා" යනු දිශායොගාවේදාහරණයි—සො, ඒ සර්වඥතෙමේ, තදා, එකල්හි; දිසායොගෙන, දිශායොගයෙන-"භොරාජ" යනු ආලපනාවේදාහරණයි—භොරාජ, පින්වත්රජ)

**ප්‍රථමාවිභක්ත්‍යර්ථය සමාප්තයි—1**

(මෙසේ ප්‍රථමාවිභක්ත්‍යර්ථය දක්වා දැන් ද්විතීයාවිභක්ත්‍යර්ථය දක්වනපිණිස "කතමො" යන ආදිය කීය)

දුතියා දසත්ථො, ද්විතීයාවිභක්තියගේ
දශාර්ථය තෙම, කතමො, කවරේද?.

(9) කම්මයොගෙසු කම්මප්පවචනීයෙච * කරණෙ
ච්චන්තයොගෙ සම්පදානෙ අවධිභුම්මසාමියෙසු
කාලෙත්වෙව එතෙසු අනේසු දුතියාමතා

(දැන් ද්විතීයා විභක්තියගේ දශාර්ථභාවය දක්වන පිණිස "කම්මයොගෙසු" යන ආදිය කීය)

(9) කම්ම, කර්මාර්ථය; යොගෙසු, පූර්වශබ්දයාගේ යොගය යන මෙහිද; කම්මප්පවචනීයෙච, කර්මප්‍රවචනීය යොගයෙහිද; කරණෙ, කාරණාර්ථයෙහිද; අච්චන්ත යොගෙ, අත්‍යන්තසංයොගයෙහිද; සම්පදානෙ, සම්ප්‍රදානාර්ථයෙහිද; අවධි, අවධ්‍යර්ථය; භුම්ම, ආධාරාර්ථය; සාමියෙසු, ස්වාම්‍යර්ථය යන මෙහිද, කාලෙත්ව එව, කාලාර්ථයෙහිද යන; එතෙසු අනේසු, මේ අර්ථයන්හි, දුතියා, ද්විතීයාවිභක්තිතොමෝ (වේයයි) මතා, දන්නාලද්දීය.

(මෙහි කර්මප්‍රවචනීය නම් සංස්කෘතග්‍රන්ථයෙහි කරනලද සංඥා නිර්දේශයෙකි—හේ "පරසමඤ්ඤාපයොගෙ" යන මෙයින් සංගෘහීතයි—"පබ්බජිත මනුපබ්බජි" යන මෙහි ලක්‍ෂණාර්ථයෙහි වැටෙන්නාවූ අනුශබ්දයහට කර්මප්‍රවචනීය සංඥා කියනලද්දීය—මෙහි ප්‍රමුතැනැත්තාගේ ප්‍රව්‍රජිතභාවය පශ්චිම තැනැත්තාගේ ප්‍රව්‍රජිතභාවයට උපලක්‍ෂණයි--"නදිමන්වවසිතා බාරනසී" යන ආදියෙන් සනාථවාචකවූ එව අනුශබ්දයහට කර්මප්‍රවචනීය සංඥා කියනලද්දීය—බාරානසී, බරනැස, නදිං අනු, නදියනා; අවසිතා, අවබද්ධය යන අර්ථයි—"අනුසාරිපුත්තං පඤ්ඤවා භික්ඛු" යන ආදියෙන් හීනාර්ථවාචකවූ එමඅනුශබ්දයහට කර්මප්‍රවචනීය සංඥා කියනලද්දීය-පඤ්ඤවා භික්ඛු, ප්‍රඥාඇති භික්‍ෂූ

* "කම්මයොගෙන කම්මප්පවචනීයෙසු" ති පාඨො

(10) රථං කරෙති පුබ්බත ගාමං රමනීයං හි තං
පබ්බජ්ජං අනු පබ්බජි සචෙ මං නාලපිස්සති.

(11) සතනාහං භොජනං භුඤ්ජි යොජනං වනරජීව
පටිභාතු මං භගවා මනුස්සමංසං විරමං.

තෙම; සාරිපුත්තං අනු, ශාරිපුත්‍රස්ථවිරයන්ට හීනයි— ලක්ෂණාර්ථයෙහිද ඉත්ථම්භූතාර්ථයෙහිද භාගාර්ථයෙහි ද වීප්ෂායෙහිද වැටෙන්නාවූ 'පති පරි අනු'' යන මේ උ සර්ගයන්ට කර්මප්‍රවචනීය සංඥා කියනලද්දිය—''රුක්ඛං පති විජ්ජොතතෙ චන්දො'' (රුක්ඛංපරි රුක්ඛං අනු) යනු ලක්ෂණාර්ථයෙහි නිදර්ශනයි-එහි වෘක්ෂය බබලන්නාවූ චන්ද්‍රයාට උපලක්ෂණ භාවයෙන් ගන්නාලදි''-''සාධු දෙවදත්තො මාතරං පති'' (මාතරං පරි මාතර මනු) යනු ඉත්ථම්භූතාර්ථයෙහි නිදර්ශනයි—''යදෙත්ථ මංපති සියා(මං පරි, මං අනු)තං දීයතු'' යනු භාගාර්ථයෙහි නිදර්ශනයි—එත්ථ, මෙහි; යං, යමක්; මංපති සියා, මාගේ කොටස වන්නේද; තං, එය; දීයතු, දෙනුලැබේවා—''රුක්ඛං රුක්ඛං පති විජ්ජොතතෙ, (රුක්ඛං රුක්ඛං පරි, රුක්ඛං රුක්ඛං අනු) යනු වීප්ෂායොගයෙහි නිදර්ශනයි—භාගාර්ථ සහාර්ථ හීනාර්ථවර්ජිතවූ එම අර්ථයන්හි වැටෙන්නාවූ අභිශබ්දයහටද කර්මප්‍රවචනීය සංඥා කියනලද්දිය—උදාහරණ පති ශබ්දාදීන්ට මෙන් ගෙ දියයුතු)

(දැන් ද්විතීයා විභක්ත්‍යුදාහරණයන් දක්වන්නේ ''රථං කරෙති'' යනාදිය කිය)

(10) රථං කරෙති, රථං කරෙති යනුද; පුබ්බත ගාමං රමනීයං හි තං, පුබ්බත ගාමං රමනීයං හි තං යනුද; පබ්බජ්ජං අනුපබ්බජි, පබ්බජ්ජං අනුපබ්බජි යනුද; සචෙ මං නාලපිස්සති, සචෙ මං නාලපිස්සති යනුද.

(11) සතනාහං භොජනං භුඤ්ජි යොජනං වන රජීව, සතනාහං—පෙ—වනරජි යනුද; පටිභාතු මං භග

(12) අගාරං අජ්ඣාවසතා භික්ඛු සංඝඤ්ච පිට්ඨිතො
පුබ්බණ්හසමයංත්‍යාදී පයොගානි යථාරහං.

## ද්විතීයාවිභක්ත්‍යර්ථසංග්‍රහගාථා—2

චා, පටිභාතු මං භගවා යනුද, මනුස්සමංසා විරමං, මනු ස්සමංසං විරමං යනුද.

12 අගාරං අජ්ඣාවසතා, අගාරං අජ්ඣාවසතා යනුද; භික්ඛුසංඝංච පිට්ඨිතො, භික්ඛුසංඝංච පිට්ඨිතො යනුද; පුබ්බණ්හසමයං පුබ්බණ්හසමයං යනුද; ඉති, ආදි, මෙම් ආදිවූ, පයොගානි, උදාහරණයෝ; යථාරහං, සුදුසු පරිද්දෙන්, (දතයුත්තාහු) වෙත්.

(මෙහි "රථං කාරෙති" යනු කර්මාර්ථයෙහි විතීයායි රථං, රියයක්, කාරෙති, කෙරේ—"පුබ්බෙන ගාමං රමනීයංති තං" යනු පූර්වශබ්දයාගේ යොගයෙහි විතීයායි—රමනීයං ති, රම්‍යවූම; තං ගාමං, ඒ ගමින්; පුබ්බෙන, පූර්වයෙහි—මෙහි "පුබ්බෙන" යනු සප්තම්‍යර්ථයෙහවූ තෘතීයායි—"පබ්බජ්ජං අනුපබ්බජි" යනු කර්මප්‍රවචනීය යොගයෙහි විතීයායි "පබ්බජ්ජං අනු, ප්‍රව්‍රජ්‍යාඇත්තනු ලක්ෂණකොට; පබ්බජි, පැවිදිවී—"සචෙ මං නාලපිස්සති" යනු කරණාර්ථයෙහි විතීයායි, සචෙ, ඉදින්; මං, මාහාසමග; න ආලපිස්සති, කථානොකරන්නේ නම්—"සත්තාහං භොජනං භුඤ්ජි යොජනං චනරජි" යනු අත්‍යන්තසංයොගයෙහි විතීයායි—'සත්තාහං භොජනං, යනු කාලාත්‍යන්ත සංයොගය—"යොජනං චනරජි" යනු මාර්ගාත්‍යන්ත සංයොගයි—සත්තාහං, සතියක්මුලුල්ලෙහි, භොජනං, බොජුන්, භුඤ්ජි, අනුභවකෙළේය—යොජනං, ගොව්වක්මුලුල්ලෙහි; චනරජි, චනරෙබාවයි-"පටිභාතු මං භග

## කතමෙ තතියා සොළසත්ථා?

(13) කරණෙ කත්තු කම්මෙච ක්‍රියා පවග්ග ලක්ඛණෙ
කාලද්ධානපච්චත්තෙසු අවධි හෙතුනිමිත්තකෙ....

වා'' යනු සම්ප්‍රදානාර්ථයෙහි ද්විතීයායි—භගවා, භාග්‍යවත්තෙමේ; මං, මාහට, පටිභාතු, අවබෝධකෙරේවා—මෙහි පතිපුබ්බ "භා අවබොධනෙ'' යන ධාතුයි "මනුස්සමංසං විරමං'' යනු අපාදානාර්ථයෙහි ද්විතීයායි, මනුස්සමංසං, මනුෂ්‍යමාංසයෙන්; විරමං, වැළැක්කෙමි, "අගාරං අජ්ඣාවසතා'' යනු ආධාරාර්ථයෙහි ද්විතීයායි, අගාරං, ගිහිගෙයි; අජ්ඣාවසතා, වසන්නාහුම්සින්—"භික්ඛුසංඝංච පිටසීතො'' යනු ස්වාම්‍යර්ථයෙහි ද්විතීයායි, භික්ඛුසංඝංච, භික්ෂුසංඝයාගේද; පිටසිතො, පස්සෙන්—"පුබ්බණ්හසමයං'' යනු කාලාර්ථයෙහි ද්විතීයායි—පුබ්බණ්හසමයං, පෙරවරු කාලයෙහි)

### ද්විතීයාවිභක්ත්‍යර්ථ සමාප්තයි—2

(මෙසේ ද්විතීයාවිභක්ත්‍යර්ථය දක්වා දැන් තෘතීයාවිභක්ත්‍යර්ථය දක්වන්නේ "කතමෙ තතියාසොළසත්ථා'' යන ආදිය කීය)

තතියාසොළසත්ථා, තෘතීයාවිභක්තියගේ
ෂොඩශාර්ථයතෙම; කතමෙ, කවරේද?

(13) කරණෙ, කරණාර්ථයෙහිද; කත්තු, කර්තෘර්ථය; කම්මෙච, කර්මාර්ථය යන මෙහිද; ක්‍රියාපවග්ග, ක්‍රියාපවර්ගාර්ථය, ලක්ඛණෙ, ලක්ෂණාර්ථය යන මෙහිද, කාල, කාලාර්ථය; අද්ධාන, මාර්ගාර්ථය; පච්චත්තෙසු, ප්‍රථමාර්ථය යන මෙහිද; අවධි, අපාදානාර්ථය; හෙතු, හෙත්වර්ථය; නිමිත්තකෙ, නිමිත්තාර්ථය යන මෙහිද ----

(14) සහත්ථාද්‍යඞ්ග ... විසෙසනාදිකෙ තුමෙව
තතියා වාචකා ... සොළසත්ථාදිකෙසුපි—

(15) රුක්ඛං ජිඝච්ඡති භගවතා ධම්මො බුද්ධෙන දෙසිතො
තිලෙහි ඛෙත්තං වපති එකාහෙනෙව පාපුණි—

(16) කාළී තිනෙත්තා සීසෙන ඤූපෙති පටිසෙවකො
කාලෙන ධම්මසවණං යොජනෙනාතිධාවති—

(17) අත්තනාසම්මන්තයන්තානං තෙනමුත්තාම්හසෙ මයං*
ධම්මෙන වසති භික්ඛු භාගොදත්තෙන භාසතෙ.

(14) සහාර්ථාදි, සහාර්ථාදියෙහිය; අඞ්ග, අඞ්ගවිකාරයෙහි; සම්බන්ධ, සම්බන්ධය යන මෙහිද; විසෙසනාදිකෙ, විශෙෂණාදියෙහිද; තුමෙව. ආධාරයෙහිද යන; සොළසත්ථාදිකෙසු අපි, ෂොඩශාර්ථාදියෙහිද; තතියා වාචකා හොන්ති, තෘතීයා වාචක වේත්—

(“සහත්ථාදි” යන මෙහි ආදිශබ්දයෙන් “සඞ්ඝං සමං ඤානා විනා අලං” යන ආදිය ගැණේ)

(දුන් තෘතීයාවිභක්ත්‍යුදාහරණය දක්වනපිණිස “රුක්ඛං ජිඝච්ඡති භගවතා” යන ආදිය කිය)

(15) රුක්ඛං ජිඝච්ඡති භගවතා, රුක්ඛං ජිඝච්ඡති භගවතා යනුද; ධම්මො බුද්ධෙන දෙසිතො, ධම්මො බුද්ධෙන දෙසිතො යනුද; තිලෙහි ඛෙත්තං වපති, තිලෙහි ඛෙත්තං වපති යනුද; එකාහෙනෙව පාපුණි, එකාහෙනෙව පාපුණි යනුද—

(16) කාළී තිනෙත්තා සීසෙන ඤූපෙති පටිසෙවකො; කාළී තිනෙත්තා සීසෙන ඤූපෙති පටිසෙවකො යනුද; කාලෙන ධම්මසවණං, කාලෙන ධම්මසවණං යනුද; යොජනෙනාතිධාවති, යොජනෙනාතිධාවති යනුද—

(17) අත්තනා සම්මන්තයන්තානං, අත්තනා සම්මන්තයන්තානං යනුද; තෙන මුත්තාම්හසෙ මයං, තෙනමු

* “මුත්තාභිහෙමත” ඉති සබ්බපොත්ථකෙසු —

(18) පුත්තෙන සහ තුලෙනසො කාණං පස්සති චක්ඛුනා
සුවණ්ණේන අභිරූපො ජාතියා සත්තවස්සිකො
තෙන ඛො පන සමයෙන පයොගානි යථාරහං.

තතියාවිභත්‍යන්තා සමත්තා —

නාමගෙන මගං යනුද; ධම්මේන වසතී භික්ඛු, ධම්මෙන වසති භික්ඛු යනුද; නාගො දන්තෙන හඤ්ඤතෙ, නාගො දන්තෙන හඤ්ඤතෙ යනුද—

(18) පුත්තෙන සහ තුලෙත සො, පුත්තෙන සහ තුලෙත සො යනුද; කාණං පස්සති චක්ඛුනා, කාණං පස්සති චක්ඛුනා යනුද; සුවණ්ණේන අභිරූපො, සුවණ්ණේන අභිරූපො යනුද; ජාතියා සත්තවස්සිකො, ජාතියා සත්තවස්සිකො යනුද; තෙන ඛො පන සමයෙන, තෙන ඛො පන සමයෙන යනුද; පයොගානි, උදාහරණයෝ; යථාරහං, සුදුසුපරිද්දෙන් (දතයුත්තානු)වෙන්—

("රුක්ඛං ඡින්දති ඛග්ගෙන" යනු කරණාර්ථොදාහරණය—ඛග්ගෙන, කඩුව කරණකොටගෙණ; රුක්ඛං, වෘක්ෂය; ඡින්දති, සිඳී—ඛග්ගෙන යනු ඛග්ගශබ්දයාගෙරෙන් "යෙනවාකයිරතෙතංකරණං" යන සූත්‍රයෙන් කරණ සංඥකොට තෘතීයාඒකවචනකොට "අතොනෙන" යන සූත්‍රයෙන් අකාරාන්තයාගෙරෙන් නාහට එන යන ආදෙශ කළකල්හි රූපසි—"ධම්මො බුද්ධෙන දෙසිතො" යනු කර්තෘර්ථොදාහරණය-බුද්ධෙන, බුදුන්විසින්; ධම්මො, ධර්මයතෙම; දෙසිතො, දෙසනලදී—"තිලෙහි ඛෙත්තෙ වපති" යනු කර්මාර්ථොදාහරණය; ඛෙත්තෙ, කෙතෙහි; තිලෙහි, තල; වපති, වපුරයි-"එකාහෙනෙව පාපුණි" යනු ක්‍රියාපවර්ගාර්ථොදාහරණය—එකාහෙන එව, එක්දවසකින්ම; පාපුණි, පැමිණියේය—"කාලී ත්තිනෙනන සීසෙන ඝඤ්ඤපෙති පරිතෙසව

ඛො'' යනු ලක්ෂණාර්ථොදාහරණය—කාළී, කාළීතෙ මෝ; භින්නෙන, බිඳුනාවූ; සීසෙන, ශීර්ෂයෙන් උපලක්ෂිතව; පටිසෙවකො, ප්‍රතිසෙවකයන්ට; ඤායති, හඟවයි—''කාලෙන ධම්මසවණං'' යනු කාලාර්ථොදාහරණය; කාලෙන, සුදුසුකාලයෙහි; ධම්මසවණං, බණඇසීම යි—''යොජනෙනාතිධාවති'' යනු මාර්ගාර්ථොදාහරණය—යොජනෙන, යොත්නෙක්හි; අතිධාවති, ඉනාදිවේ—''අත්තනාසම්මන්නය්‍යත්තානං'' යනු ප්‍රථමාර්ථොදාහරණය-අත්තනා, තෙමේ; අත්තානං, තමා, සම්මනති, සම්මත කෙළේය—''තෙනමුත්තාම්හසෙ මයං'' යනු අපාදානාර්ථොදාහරණය—මයං, අපි; තෙන, ඒ මහාශ්‍රමණයා කෙරෙන්; මුත්තාඅම්හසෙ, මිදුනාහු වෙමු—''ධම්මෙන වසති භික්ඛූ'' යනු හෙත්වර්ථොදාහරණය--භික්ඛූ, මහණ තෙම; ධම්මෙන, ධර්ම්‍ය හෙතුකොටගෙණ; වසති, වෙසේ—''නාගො දන්තෙන හඤ්ඤතෙ'' යනු නිමිත්තාර්ථොදාහරණය-නාගො, ඇත් තෙමේ; දන්තෙන; දත් නිමිතිකොටගෙණ; හඤ්ඤතෙ, නසනුලැබේ-''පුත්තෙන සහ තුලෙන සො'' යනු සහාර්ථොදාහරණය—සො, ඒ පියතෙමේ; පුත්තෙන සහ, පුත්‍රයාහා; තුලෙන, සමානයි—''කාණං පස්සති චක්ඛුනා'' යනු අඞ්ගවිකාරාර්ථොදාහරණය—චක්ඛුනා, ඇසින්; කාණං, කණා; පස්සති, බලයි—මේ උදාහරණය අඞ්ගවිකාරාර්ථයෙහි නොගැළපේ; අඞ්ගවිකාරනම් ශරීරාවයවයාගේ විකෘතියී මිට ''අක්ඛිනා කාණො—පාදෙන ඛඤ්ජො—හත්ථෙන කුණී'' යන ආද්‍ය උදාහරණ වියයුතු හෙයිනි-මෙහි විස්තර බාලාවතාරාදියෙන් ගතයුතුයි—''සුවණ්ණෙන අභිරූපො'' යනු සම්බන්ධොදාහරණය—සුවණ්ණෙන, යහපත්වර්ණයෙන්; අභිරූපො, මනාරූඇත්තේ—''ජාතියා සත්තවස්සිකො'' යනු විශෙෂණාර්ථොදාහරණය-ජාතියා,

### කතමො. චතුත්ථීචුද්දසණ්ණො?

(19) සම්පදානෙ නතියණේ යොගෙ කම්මෙච ආරභෙ
අනුමතානාදරණේසු තුං තදත්ථාලසාමිසු*
භුම්මෙච දස්සනණේච චතුත්ථී චුද්දසෙ මතා†—

ජාතියෙන්; සත්තවස්සිකො, සත්හැවිරිදිවයස් ඇත්තේ ය—"තෙන ඛො පන සමයෙන" යනු සප්තම්‍යර්ථොදාහරණය—තෙන ඛො පන සමයෙන, එසමයෙහි වනාහි)

### තෘතීයාවිභක්ත්‍යර්ථය සමාප්තයි—3

(මෙසේ තෘතීයාවිභක්ත්‍යර්ථය දක්වා දුන් චතුර්ථීවිභක්ත්‍යර්ථය දක්වනපිණිස "කතමො චතුත්ථීචුද්දසණ්ණො" යන ආදිය කීය)

චතුත්ථීචුද්දසණ්ණො, චතුර්ථීවිභක්තියගේ
චතුර්දශාර්ථයතෙම; කතමො, කවරේද?

(19) සම්පදානෙ, සම්ප්‍රදානාර්ථයෙහිද; නතියණේ, නෘතීයාර්ථයෙනද; යොගෙ, (නමො) යොගයෙනද; කම්මෙච, කර්මාර්ථයෙහිද; ආරභෙ, ආරබ්ධනාර්ථයෙහිද; අනුමත, අනුමතාර්ථය; අනාදරණේසු, අනාදරාර්ථය යන මෙහිද; තුං, තුංප්‍රත්‍යයාගේ අර්ථය, තදත්ථ, තදර්ථය; අලං, අලංශබ්දයාගේ අර්ථය; සාමිසු, ස්වාම්‍යර්ථය යන මෙහිද; භුම්මෙච, ආධාරාර්ථයෙහිද; දස්සනණේච, දර්ශනාර්ථයෙහිද; යන, චුද්දසෙ, තුදුස් අර්ථයෙහි; චතුත්ථී, චතුර්ථීවිභක්තිතොමෝ (වේයයි) මතා, දත්නාලද්දීය—

* 'තුංතදත්ථාලසාමිවා'ති සබ්බත්.
† "චුද්දසචතුත්ථීමතා"ති සබ්බත්

(20) භික්ඛුස්ස දෙති යො පරි,ක්ඛීණස්ස අඤ්ඤං පිහයං
නමො තෙ බුද්ධවීරත්ථු සගගස්ස ගමෙනතක වා......

(21) ආරද්ධො මෙ රජ්ජ හොති බුද්ධස්ස ආසුණන්ති තෙ*
කට්ඨස්ස තං අහ මඤ්ඤෙ බුද්ධත්ථං ජීවිතං චජි......

(22) අනුකම්පාය දෙසෙන්තු අලමෙම රතනත්තයං
අලමෙම තෙන ධඤ්ඤෙන දිනෙනා අත්ථාය මෙ භවං†.

---

(දැන් උදාහරණ දක්වනුපිණිස ''භික්ඛුස්ස දෙති'' යන ආදිය කීය)

20 භික්ඛුස්ස දෙති යො, භික්ඛුස්ස දෙති යො යනුද පරික්ඛීණස්ස අඤ්ඤං පිහයං, පරික්ඛීණස්ස අඤ්ඤං පිහයං යනුද; නමො තෙ බුද්ධවීරත්ථු, නමො තෙ බුද්ධවීරත්ථු යනුද; සගගස්ස ගමෙනතක වා, සගගස්ස ගමෙනතක වා යනුද......

(21) ආරද්ධො මෙ රජ්ජ හොති, ආරද්ධො මෙ රජ්ජ හොති යනුද; බුද්ධස්ස ආසුණන්ති තෙ, බුද්ධස්ස ආසුණන්ති තෙ යනුද, කට්ඨස්ස තං අහං මඤ්ඤෙ, කට්ඨස්ස තං අහං මඤ්ඤෙ යනුද, බුද්ධත්ථං ජීවිතං චජි, බුද්ධත්ථං ජීවිතං චජි යනුද......

(22) අනුකම්පාය දෙසෙන්තු, අනුකම්පාය දෙසෙන්තු යනුද; අලං මෙ රතනත්තයං අලං මෙ තෙන ධඤ්ඤෙන, අලං මෙ රතනත්තයං අලං මෙ තෙන ධඤ්ඤෙන යනුද දිනෙනා අත්ථාය මෙ භවං, දිනෙනා අත්ථාය මෙ භවං යනුද......

---

* ''ආසුණන්ති බුද්ධස්ස තෙ'' ති පොත්ථකෙසු.

† ''අත්ථාය මෙ භවං දිනෙනා'' ති සබ්බත්ථ,

(23) තුය්හං වස්ස අධිකරෙ දස්සනං කාමතා තව
තෙසු තෙසු සුත්තන්තෙසු යුත්තිං ගණ්හෙය්‍ය පණ්ඩිතො.

**චතුත්ථීවිභත්‍යත්ථො සමත්තො—4**

(23) තුය්හං වස්ස අධිකරෙ, තුය්හං වස්ස අධිකරෙ යනුද; දස්සනං කාමතා තව, දස්සනං කාමතා තව යනුද උදාහරණයි; පණ්ඩිතො, ප්‍රාඥතෙමේ; තෙසු තෙසු සුත්තන්තෙසු, ඒ ඒ සූත්‍රාන්තයෙහි; යුත්තිං, ප්‍රයොගය; ගණ්හෙය්‍ය, ගන්නේය.

(‘භික්ඛුස්ස දෙති යො’ යනු සම්ප්‍රදානොදාහරණය-යො, යමෙක්තෙම; භික්ඛුස්ස, භික්ෂුවක්හට; දෙති, දේද- ‘‘භික්ඛුස්ස’’ යනු භික්ඛුශබ්දයාමකාරෙන් ‘‘ජිනවචනයුත්තං හි’’ යනු වචා විභක්ත්‍යුත්පත්තිය කොට ඒවිභක්ත්‍යර්ථයෙහිද අභිධායක ප්‍රසිද්ධියක් ඇතිකල්හි සම්ප්‍රදානසංඥා කොට ‘‘සම්පදානෙ චතුත්ථී’’ යන සූත්‍රයෙන් චතුර්ථ්‍යෙකවචන ස්‍යාදිවිභක්ති කොට ‘‘සාගමො සෙ’’ යන සූත්‍රයෙන් සකාරාගම කළකල්හි රූපසිද්ධී—‘‘පරිකම්මස්ස අඤ්ඤං පිහයං’’ යනු තාදර්ථ්‍යොදාහරණය—පරිකම්මස්ස, කර්මවිමෙන්, අඤ්ඤං, අනිකක්; පිහයං, කැමැතිවන්නේ-‘‘නමො තෙ බුද්ධවීරත්ථු’’ යනු නමොයොගොදාහරණය—බුද්ධවීර, බුද්ධවීරය, තෙ, තොපවහන්සේට; නමො අත්ථු, නමස්කාර වේවා—‘‘සග්ගස්ස ගමනෙන වා’’ යනු කර්මාර්ථොදාහරණය—සග්ගස්ස, ස්වර්ගයට; ගමනෙන වා, යාමෙන්හෝ—‘‘ආරාධො මෙ රඤ්ඤො හොති’’ යනු ආරාධනාර්ථොදාහරණය—රඤ්ඤො; රජතෙම; මෙ, මට, ආරාධො හොති, ආරාධක වේ—‘‘බුද්ධස්ස අඤ්ඤ

ජානන්ති තෙ'' යනු අනුකත්තාර්ථෝදාහරණය-තෙ, ඔව්හු; බුද්ධස්ස, බුදුන්ට; අනුජානන්ති, ප්‍රතිඥා දෙත්-''කට්ඨස්ස ත්වං අහං මඤ්ඤෙ'' යනු අනාදරාර්ථෝදාහරණය—අහං, මම; ත්වං, තා; කට්ඨස්ස, කාෂ්ඨයක් කොට, මඤ්ඤෙ, හඟිමි—''බුද්ධස්ස ජීවිතං චජි'' යනු තුංප්‍රත්‍යයාර්ථෝදාහරණය—බුද්ධස්සං, බුදුවන්ට, ජීවිතං, ජීවිතය; චජි, හැරියේය—''අනුකම්පාය දෙසෙන්තු'' යනු තදර්ථෝදාහරණය—අනුකම්පාය, අනුකම්පාපිණිස, දෙසෙන්තු, දෙශනා කෙරෙත්වා-''අලං මෙ රතනත්තයං--අලං මෙ තෙන ඛණෙනන'' යනු අලංශබ්දාර්ථෝදාහරණය—මෙ, මට; රතනත්තයං, රත්නත්‍රය; අලං, සුදුසුයි—මේ, මට; තෙන ඛණෙනන, ඒ ඛණයෙන්; අලං, කම්තැත—''දිනෙනතා අත්ථාය මෙ භවං'' යනු සාම්‍යර්ථෝදාහරණය—භවං, පින්වත්තෙමේ; මෙ, මාගේ; අත්ථාය, අර්ථයපිණිස; දිනෙනතා, දුන්නේය—''තුය්හං චස්ස ආවිකරෙ'' යනු ආධාරාර්ථෝදාහරණය—තුය්හංච, තාකෙරෙහිද; අස්ස, ඕහුකෙරෙහිද; ආවිකරෙ; ප්‍රකාශ කරන්නේය—''දස්සනං කාමතා තව'' යනු දර්ශනාර්ථෝදාහරණය—තව, තාගේ; දස්සනං, දැක්ම; කාමතා. කැමතිබව)

## චතුර්ථී විභක්ත්‍යර්ථය සමාප්තයි—4

(මෙසේ චතුර්ථීවිභක්ත්‍යර්ථය දක්වා දැන් පඤ්චමී විභක්ත්‍යර්ථය දක්වනපිණිස ''කථමො පඤ්චමීවුඥය ගො'' යන ආදිය කීය)

### කතමො පඤ්චමී චුද්දසකො,

(24) අවධි භුම්ම සම්බන්ධ කම්ම හෙතු ඤත්තියකො *
ගුණධාන විච්ඡන්නකො මජ්ඣ පභව රක්ඛණෙ
යොගකො කාලකො චතු,දසකො පඤ්චමී භවෙ† —

25) පාපා චිත්තං නිවාරයෙ යස්මා ධොමං තතො භයං
පුරිසස්මා පාද, එලි සුවණ්ණස්මා පටිදද—

26) කස්මා හෙතු නමීයන්ති සතස්මා බලබා නරෙ
පඤ්ඤාය සුගතිං යන්ති ඉතො චතුසු යොජනෙ—

(24) අවධි, අවධ්‍යර්ථය, භුම්ම, ආධාරාර්ථය; සම්බන්ධ, ස්වාම්‍යර්ථය යන මෙහිද; කම්ම, කර්මාර්ථය, හෙතු, හෙත්වර්ථය; ඤත්තියකො, ඥප්ත්‍යර්ථය යන මෙහිද; ගුණ, ගුණාර්ථය; අධාන, මාගීාර්ථය, විච්ඡන්නකො, විච්ඡින්නාර්ථය යන මෙහිද; මජ්ඣ,(කාරකමධ්‍යාර්ථයෙහිහා ක්‍රියා) මධ්‍යාර්ථයෙහිද; පභව, ප්‍රභවාර්ථය; රක්ඛණ, රක්ෂණාර්ථය යන මෙහිද; යොගකො, යොගාර්ථයෙහිද කාලකො, කාලාර්ථයෙහිද (යන) චතුදසකො, තුදුස් අර්ථයෙහි; පඤ්චමී, පඤ්චමීවිභක්තිතොමෝ; භවෙ, වන්නේය—

(දූන් උදාහරණ දක්වනපිණිස "පාපා චිත්තං නිවාරයෙ" ය න ආදිය කීය)

(25) පාපා චිත්තං නිවාරයෙ; පාපා චිත්තං නිවාරයෙ යනුද, යස්මා ධොමං තතො භයං; යස්මා ධොමං තතො භයං යනුද, පුරිසස්මා පාද එලි; පුරිසස්මා පාද එලිතා යනුද, සුවණ්ණස්මා පටිදද, සුවණ්ණස්මා පටිදදති යනුද—

(26) කස්මාහෙතු නමීයන්ති, කස්මාහෙතු නමීයන්ති

* 'කම්මහෙතු ඤත්තියාචා'ති සබ්බත්ථ.

† "යොගකො කාලකොචෙව චතුදසකො"ති සබ්බත්‍ර

(27) විවිත්තො පාපකා ධම්මා කොසා විජ්ඣති කුඤ්ජරං
හිමවතා පභවන්ති කාකෙ රක්ඛන්ති තණ්ඩුලා

(28) කිංවදූරෙ ඉතො ගාමො ඉතො එකනවුතිච
පක්ඛිපිණ්ඩවණ්ණඅඤ්ඤාදිසංයොගයසංපයොගවිසද්ධෙනා

පඤ්චමී විභක්ත්‍යර්ථ සංග්‍රහය—5

යනුද, සතස්මා බද්ධො නරො; සතස්මා බද්ධො නරො යනුද, පඤ්ඤාය සුගතිං යන්ති; පඤ්ඤාය සුගතිං යන්ති යනුද, ඉතො චතුසු යොජනෙ, ඉතො චතුසු යොජනෙසු යනුද—

(27) විවිත්තො පාපකා ධම්මා, විවිත්තො පාපකා ධම්මා යනුද; කොසා විජ්ඣති කුඤ්ජරං, කොසා විජ්ඣති කුඤ්ජරං යනුද; හිමවතා පභවන්ති, හිමවතා පභවන්ති යනුද; කාකෙ රක්ඛන්ති තණ්ඩුලා, කාකෙ රක්ඛන්ති තණ්ඩුලා යනුද—

(28) කිංවදූරෙ ඉතො ගාමො, කිංවදූරෙ ඉතො ගාමො යනුද; ඉතො එකනවුතිච, ඉතො එකනවුති කප්පෙ, යනුද උදාහරණයි—එකටි, එම්හි; අඤ්ඤාදිසං, සමු ප්‍රයොගයන්, පක්ඛිපිණ්ඩා, බහලාහු; පධානවිසද්ධෙනා, ප්‍රයොග දක්නනුවිසින්; යොජනසං, දතාසුක්තේය—

("පාපා චිත්තං නිවාරයෙ" යනු අපාදානොදාහරණය—පාපා, පාපයෙන්; චිත්තං, සිත; නිවාරයෙ, වළක්වන්නේය—"යස්මා වෙරං තතො භයං" යනු ආධාරොදාහරණය—යස්මා, යම්තැනෙකින්; වෙරං, නිතීනයද; තතො, එයින්; භයං, භය උපදී—"පුරිසස්මා පාදා ඵලිතා" යනු සම්බන්ධොදාහරණය—පුරිසස්මා, පුරුෂයාගේ; පාදා, පාදයෝ; ඵලිතා, පැලුනාහුය—"සුවණ්ණස්මා පටිදදන්ති" යනු කම්මොදාහරණය—සුව

ර්‍ණසමා, රජරන්; පවිද්ධාති, නැවත දෙයි—"කස්මා හෙතු නමීයන්ති" යනු හෙත්වර්ථොදාහරණය—කස්මා හෙතු, කවර හෙතුවකින්; නමීයන්ති, නොමැරෙද්ද—"සකාසමා බංධො නරො" යනු ඥාත්‍යර්ථොදාහරණය—නරො, මනුෂ්‍යතෙම; සකාසමා, සියයකින්; බංධො, බැඳුනේය—"පඤ්ඤාය සුගතිං යන්ති" යනු ගුණාර්ථොදාහරණය—පඤ්ඤාය, ප්‍රඥාවෙන්; සුගතිං, සුගතියට, යන්ති, යෙත්—"ඉතො චතුසු යොජනෙසු" යනු මාර්ගාර්ථොදාහරණය—ඉතො, මෙයින්; චතුසු යොජනෙසු, සිව්යොදුනෙහි—"විවිත්තො පාපකා ධම්මා" යනු විවිත්තාර්ථොදාහරණය—පාපකා ධම්මා, පාපධර්මයෙන්; විවිත්තො, වෙන්වී—"කොසා විජ්ඣති කුඤ්ජරං" යනු කාරක මධ්‍යාර්ථොදාහරණය—කොසා, අවසනකින්; කුඤ්ජරං, ඇතා; විජ්ඣති, විදී—"හිමවතා පභවන්ති" යනු ප්‍රභවාර්ථොදාහරණය— හිමවතා, හිමවතින්; පභවන්ති, (ගඞ්ගාවෝ) උපදිත්—"කාණකා රක්ඛන්ති තණ්ඩුලා" යනු රක්‍ෂණාර්ථොදාහරණය—කාණකා, කවුඩන්; තණ්ඩුලා, සාලින්; රක්ඛන්ති, රකිත්—"කීවදූරෙ ඉතො ගාමො" යනු යොගාර්ථොදාහරණය—ඉතො, මෙතැන්පටන්; ගාමො, ගම; කීවදූරෙ, කොතෙක්දුරද?—"ඉතො එකනවුතිකප්පෙ" යනු කාලාර්ථොදාහරණය—ඉතො, මේමහාභද්‍රකල්පයෙන්; එකනවුතිකප්පෙ, එක්අනූවන කල්පයෙහි.)

### පඤ්චමී විභක්ත්‍යර්ථය සමාප්තයි—5

(මෙසේ පඤ්චමී විභක්ත්‍යර්ථය දක්වා දැන් ෂෂ්ඨී විභක්ත්‍යර්ථය දක්වන්නේ "කතමො ඡට්ඨී එකාදසනො" යනු ආදිය කීය)

## සත්තමා ඡට්ඨී එකාදසත්ථා

(29) සාමඤ්ඤෙත්ථෙහෙතුයොගෙත්ථෙකත්තුකම්මෙචකරණෙ
අවධ්‍යනාදරත්ථෙසු නිද්ධාරණෙ භුම්මෙපිච
තදත්ථෙ කාදසත්ථම්හි ඡට්ඨීවාචකා විඤ්ඤෙය්‍යතා —

(30) භික්ඛුස්ස චීවරං කිස්ස හෙතු ගොණානධිපති
සොධිරෙපූජිතොරඤ්ඤොපාපස්සඅකරණංසුඛං —

---

ඡට්ඨී එකාදසත්ථා, ෂෂ්ඨී විභක්තියගේ එකො
ළොස් අර්ථයෙනම; කතමෙ, කවරේද?

(29) සාමඤ්ඤත්ථෙ, ස්වාම්‍යර්ථයෙහිද; හෙතු. හෙත්වර්ථය යොගත්ථෙ, යොගාර්ථය යන මෙහිද, කත්තු, කර්ත්‍රර්ථය; කම්මෙච, කර්මාර්ථය යන මෙහිද; කරණෙ, කරණාර්ථයෙහිද; අවධි, අපාදනාර්ථය; අනාදරත්ථෙසු, අනාදරාර්ථය යන මෙහිද; නිද්ධාරණෙ, නිර්ධාරණාර්ථය; භුම්මෙ අපිච, ආධාරාර්ථය යන මෙහිද; තදත්ථෙ, තදර්ථයෙහිද (යන) එකාදසත්ථම්හි, එකොළොස් අර්ථයෙහි; ඡට්ඨී, ෂෂ්ඨී විභක්තිනොමෝ; වාචකා, වාචකවේයයි; විඤ්ඤෙය්‍යතා, දතයුත්තිය —

(දුන් උදාහරණ දක්වනපිණිස "භික්ඛුස්ස චීවරං කිස්ස" යන ආදිය කීය)

(30) භික්ඛුස්සචීවරං, භික්ඛුස්සචීවරං යනුද; කිස්සහෙතු, කිස්සහෙතු යනුද; ගොණානං අධිපති, ගොණානං අධිපති යනුද; සො ධිරෙ පූජිතො රඤ්ඤො, සොධිරෙ පූජිතො රඤ්ඤො යනුද; පාපස්ස අකරණං සුඛං, පාපස්ස අකරණං සුඛං යනුද —

(31) සප්පිස්ස පත්තං පූරෙත්වා භීතො දුක්ඛස්සහං සදා
රුදතො දූරකස්සච පබ්බජි බුද්ධසාසනෙ—
(32) පඤ්චකල්‍යාණි නාරීනං සාමා දස්සනීයතමා
කුසලා නච්චගීතස්ස සුවණ්ණං කුණ්ඩලස්සච—

ජට්ඨී විභත්‍යත්ථො සමත්තො—6

(31) සප්පිස්ස පත්තං පූරෙත්වා, සප්පිස්ස පත්තං පූරෙත්වා යනුද; භීතො දුක්ඛස්සහං සදා, භීතො දුක්ඛස්සහං සදා යනුද; රුදතො දූරකස්සච පබ්බජි බුද්ධසාසනෙ රුදතො දූරකස්ස පබ්බජි බුද්ධසාසනෙ යනුද—

(32) පඤ්චකල්‍යාණි නාරීනං සාමා දස්සනීයතමා, පඤ්චකල්‍යාණි නාරීනං සාමා දස්සනීයතමා යනුද; කුසලා නච්චගීතස්ස, කුසලා නච්චගීතස්ස යනුද; සුවණ්ණං කුණ්ඩලස්සච, සුවණ්ණං කුණ්ඩලස්ස යනුද උදාහරණයි—

("භික්ඛුස්සචීවරං" යනු ස්වාම්‍යර්ථෝදාහරණය—භික්ඛුස්ස, භික්ෂුවගේ; චීවරං, සිවුරයි-"කිස්සහෙතු" යනු හෙත්වර්ථෝදාහරණය—කිස්සහෙතු, කවරහෙතුවකින්-"ගොනානං අධිපති" යනු යොගාර්ථෝදාහරණය—ගොනානං, ගොනුන්ට; අධිපති, ප්‍රධානයි—"සො ධීරෙ පූජිතො රඤ්ඤා" යනු කර්තෘර්ථෝදාහරණය—රඤ්ඤා, රජහුවිසින්; සොධීරෙ, ඒ ප්‍රාඥතෙම; පූජිතො පුදනලදි—"පාපස්ස අකරණං සුඛං" යනු කර්මාර්ථෝදාහරණය—පාපස්ස අකරණං, පව්නොකිරීම; සුඛං සැපයි—"සප්පිස්ස පත්තං පූරෙත්වා" යනු කරණාර්ථෝදාහරණය—සප්පිස්ස, ගිතෙලින්; පත්තං, පාත්‍රය; පූරෙත්වා, පුරවා—"භීතො දුක්ඛස්සහං සදා" යනු අපාදානාර්ථෝදාහරණය—අහං, මම; සදා, හැමකල්හි; දුක්ඛස්ස

කතමො සත්තමෙකාදසත්ථා

(33) භුම්ම කම්ම නිමිත්තත්ථෙ කාරණෙ පඨමාවධි
චතුත්ථියොගානාදර නිද්ධාරණෙපි කාලෙච
භාවත්ථෙ කාදසත්ථෙසු සත්තමී වාචකා මතා —

දුක්ඛිත්; ජිනතො, බියදුරයේ වෙමි—''රුදතො දාරකස්ස පබ්බජි බුද්ධසාසනෙ'' යනු අනාදරාර්ථෝදාහරණය- දාරකස්ස ළදරුවා; රුදතො, අඬමින්සිටියදී; බුද්ධසාසනෙ, බුදුසස්නෙහි; පබ්බජි, පැවිදිවී—''පඤ්චකල්‍යාණ නාරීනං සාමා දස්සනීයතමා'' යනු නිර්ධාරණාර්ථෝදාහරණය සාමා, සාමා නම් තොමෝ; පඤ්චකල්‍යාණ නාරීනං, පඤ්චකල්‍යාණයෙන්යුත් ස්ත්‍රීන්අතුරෙන්; දස්සනීයතමා, අතිශයින් දැකුම්කටයුත් තී ය—''කුසලා නච්චගීතස්ස'' යනු ආධාරාර්ථෝදාහරණය—නච්චගීතස්ස, නෘත්‍යගීතයෙහි; කුසලා, දක්ෂවූවෝයි—''සුවණ්ණං කුණ්ඩලස්ස'' යනු තදර්ථෝදාහරණය—කුණ්ඩලස්ස, කොඬොළුකත්පිණිස; සුවණ්ණං, රන්යි —

ඡට්ඨී විභත්‍යර්ථ සමාප්තයි—6

(මෙසේ ඡට්ඨීවිභක්ත්‍යර්ථය විභාග කොට දක්වා දැන් සප්තමීවිභක්ත්‍යර්ථය විභාග කොට දක්වන්නේ ''කතමො සත්තමෙකාදසත්ථා,, යන ආදිය කීය)

සත්තමෙකාදසත්ථා, සප්තමියගේ
එකාදශාර්ථයෙනම, කතමෙ, කවරේද?

(33) භුම්ම, ආධාරාර්ථය; කම්ම, කර්මාර්ථය; නිමිත්තත්ථෙ, නිමිත්තාර්ථය යන මේ තෙද; කාරණෙ, කාරණාර්ථයෙද; පඨමා, ප්‍රථමාර්ථය; අවධි, අපාදානාර්ථය; චතුත්ථියොග, චතුර්ථ්‍යෝගාර්ථය; අනාදර, අනාදර

(34) ගම්භීරෙ ඔදකන්තිකෙ අභිවාදෙන්ති භික්ඛුසු
දමෙන්තසු හඤ්ඤතෙ නාගො, පමෙත්ත පිණ්ඩාය ගොචරෙ,
(35) සූරියෙ උග්ගතෙ ගජෙ රක්ඛන්තෙ කදලීසුච
මහප්ඵලං සංඝෙ දින්නං රුදන්තස්මිංච පූරකෙ—
(36) පටිකෙසුව ධාවන්තො බාලො කාලෙ පමජ්ජති*
භුඤ්ජන්තසු ආගතො චෙව සත්තමී විභත්ති මතා—

සත්තමී විභක්ත්‍යර්ථයෝ, එම තනා

ජ්වය; නිද්ධාරණෙපි, නිර්ධාරණාර්ථය යන ... ද; කා ලෙච, කාලාර්ථයෙහද; භාවෙනෙව, භාවාර්ථයෙහ (ත) එකාදසත්ථම්හි, එකො ලොස්අර්ථයෙහ; සත්තමී. සත්ත මීවිභත්තිතොමෝ; වාච්‍යා, වාච්‍යයයි; මතා, දන්නා ලද්දිය—

(දැන් උදාහරණ දක්වනපිණිස "ගම්භීරෙ ඔදක න්තිකෙ" යන ආදිය කීය)

(34) ගම්භීරෙ ඔදකන්තිකෙ, ගම්භීරෙ ඔදකන්ති කෙ යනුද; අභිවාදෙන්ති භික්ඛුසු, අභිවාදෙන්ති භික්ඛු සු යනුද; දමෙන්තසු හඤ්ඤතෙ නාගො, දමෙන්තසු හඤ්ඤ තෙ නාගො යනුද; පමෙත්ත පිණ්ඩාය ගොචරෙ, පමෙත්ත පි ණ්ඩාය ගොචරෙ යනුද—

(35) සූරියෙ උග්ගතෙ, සූරියෙ උග්ගතෙ යනුද ගජෙ රක්ඛන්ති කදලීසුච, ගජෙ රක්ඛන්ති කදලීසු ය නුද; මහප්ඵලං සංඝෙ දින්නං, මහප්ඵලං සංඝෙ දින්නං යනුද; රුදන්තස්මිංච පූරෙකෙ, රුදන්තස්මිං පූරෙකෙ යනුද;—

36) පටිකෙසුව ධාවන්තො, පටිකෙසු ධාවන්තො යනුද; බාලො කාලෙ පමජ්ජති, බාලො කාලෙ පමජ්ජ ති යනුද; භුඤ්ජන්තසු ආගතොචෙව, භුඤ්ජන්තසු ආගතො

* "බාලො කාලෙ පමුජ්ජති" හි සටහන්

යනුද; උදාහරණයි—එවං, මෙසේ; සත්තමී විභත්ති, සත්තමීවිභක්තිතොමෝ; මතා, දක්නාලද්දීය—

(“ගම්භීරෙ ඔදකන්තිකෙ” යනු ආධාරාර්ථයට උදාහරණය--ගම්භීරෙ; ගැඹුරුවූ, ඔදකන්තිකෙ; දියකෙළවරෙහි—“අභිවාදෙන්ති භික්ඛුසු” යනු කර්මාර්ථයට උදාහරණය—භික්ඛුසු, භික්‍ෂූන්; අභිවාදෙන්ති, මනාකොට වඳිත් “දන්තෙසු හඤ්ඤතෙ නාගො” යනු නිමිත්තාර්ථයට උදාහරණය—දන්තෙසු, දත්නිමිතිකොටගෙණ, නාගො; හස්තිතෙම; හඤ්ඤතෙ, නසනුලැබේ—“පත්තෙ පිණ්ඩාය ගොචරෙ” යනු කරණාර්ථයට උදාහරණය—ගොචරෙ; ගොදුරුගම්හි, පත්තෙ; පාත්‍රයකරණකොටගෙණ, පිණ්ඩාය, පිඩුපිණිස හැසිරේ—“සූරියෙ උග්ගතෙ” යනු ප්‍රථමාර්ථයට උදාහරණය--සූරියෙ, හිරු; උග්ගතෙ; නැගිකල්හි;—“ගජෙ රක්ඛන්ති කදලීසු” යනු අපාදානාර්ථයට උදාහරණය-කදලීසු; කෙසෙලින්, ගජෙ; හස්තීන්, රක්ඛන්ති,රකිත්—“මහප්ඵලං සංඝෙ දින්නං” යනු චතුර්ථ්‍යර්ථයට උදාහරණය—සංඝෙ; සංඝයාහට, දින්නං, දුන්දෙය, මහප්ඵලං,මහත්ඵලයි—“රුදන්තස්මිං දාරකෙ” යනු අනාදරාර්ථයට උදාහරණය-දාරකෙ; ළදරුවා, රුදන්තස්මිං, හඬමින්සිටියදී— “පථිකෙසු ධාවන්තො” යනු නිර්ධාරණාර්ථයට උදාහරණය—පථිකෙසු, මාර්ගිකයන්අතුරෙන්; ධාවන්තො, දිවනතැනැත්තේ(ඉතාශීඝ්‍රයි)“බාලො කාලෙ පමජ්ජති” යනු කාලාර්ථයට උදාහරණය—බාලො, බාලතෙමේ; කාලෙ, කාලයෙහි, පමජ්ජති, ප්‍රමාදවේ“ භුත්තෙසු ආගතො” යනු භාවාර්ථයට උදාහරණය-භුත්තෙසු, කෑකල්හි, ආගතො; ආයේය)

**සත්තමී විභත්ත්‍යර්ථය සමාප්තයි—7**

(මෙසේ ප්‍රථමාදිවිභක්ති සමූහය දක්වා දැන් ඊට සුදුසු

37 නිට්ඨිතොව විභත්‍යත්ථො යථා සබ්බොපි පාණිනො
තථාව සම්මාසඞ්කප්පා සීඝං සිජ්ඣන්තු පට්ඨිතා—

## විභත්‍යත්ථප්පකරණං නිට්ඨිතං

(කොට යම්සේ විභක්ත්‍යර්ථය නිමියේද එසේම ආශිසංසය දක්වන්නේ "නිට්ඨිතොච විභත්‍යත්ථො" යන ආදිය කීය)—

(37) යථා, යම්සේ; විභත්‍යත්ථො, (සප්තාශීතිප්‍රභෙද) විභක්ත්‍යර්ථයතෙම; නිට්ඨිතොච, නිමියේද; තථාඑව, එසේම, සබ්බෙපිපාණිනො, සියලුමසත්වයෝ, පට්ඨිතා, ප්‍රාර්ථිතවරවෙත්වා; සම්මාසඞ්කප්පා, සම්‍යක්සංකල්පනාවෝ, සීඝං, වහා, සිජ්ඣන්තු; සිද්ධවෙත්වා—

# විභත්‍යර්ථප්‍රකරණය

— නිමි —

1 ඤාණවිමලතිස්සො යො මහාසංඝාධිනායකො
අමරපුරනිකායං ආදෙ, සණ්ඨාපයී ඉධ—

2 තස්ස පාමොක්ඛසිස්සස්ස ධම්මාධාරසමඤ්ඤිනො
සංඝනායකථෙරස්ස සන්තො සද්ධිවිහාරිනො—

3 පටුතො ධම්මවිනයෙ සද්දසත්ථාදිකෙපිච
ලජ්ජිනො සීලවන්තස්ස සික්ඛාකාමස්ස ධීමතො—

4 සද්ධම්මාරාමථෙරස්ස ථෙරවංසස්ස කෙතුනො
පධානසිස්සභූතෙන සද්ධිවිහාරිනා—

5 ගණ්ඩකීනදියා තීරෙ ජම්බුදීපෙ මනොරමෙ
සාලිග්ගාමවරෙ උට්ඨා කුලීනවිජසඞ්කුලෙ—

6 රාජකිච්චානි සන්ධාය විප්පෙසු ආගතොස්මිධ
සාසනෙ ධම්මරාජස්ස සාරත්තස්ස විභාවිනො—

7 ඉද්ධිසීහස්ස විප්පස්ස ආලිම්මුණි සමඤ්ඤිනො
පරම්පරායාගතස්ස ඛජ්ජාතං සඤ්ඤිතො සතො—

8 ධීජ්ජඤාලිම්හිලකා ඉද්ධිසීහස්ස මනාපිනො
චතුත්ථපුත්තභූතෙන සාසනට්ඨිතිකාමිනො—

9 අමරපුරගණස්ස පධානසංඝසාමිනා
ඤාණතිලකාභිධානෙන නායකත්ථෙරෙන මෙ—

10 වච්ඡගොත්තාභිගාමස්මිං ජාතෙන සාධුනා සමං
දීඝකාලං සමිද්ධෙන පියගොනවාසිනා මම—

11 විහාරඤ්ඤස්ස ගන්ථස්ස කතායං නිජවණ්ණනා
ජිනකායත්ථප්පකාසිකා ව්‍යාඛ්‍යා ධීවුද්ධිදස්සිනී—

12 පුඤ්ඤෙනානෙන හුත්වාහං ව්‍යත්තොව ජාති ජාතියං
ලද්ධාන ව්‍යත්තසංවාසං හොමි බුද්ධො අනාගතෙ—

13 සද්ධම්මාරාම නිස්සාරථො ථෙරො මෙ ගරුපුඞ්ගවො
මාතා පිතාච ඤාතීච යන්තු මොක්ඛං ඉතො රතා—

14 චිරං තිට්ඨතු සද්ධම්මො පජං රක්ඛන්තු භූභුජා
කාලෙ වස්සතු පජ්ජුන්නො සත්තා ගච්ඡන්තු නි
බ්බුතින්ති—

---

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු